(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 361.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 මැයි මස 20 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2613/’12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහමඩගල්ල වැව නමින් යෝජිත වාරි ව්‍යාපෘතියක් ඇති බව දන්නේද;

(ii) එම වාරි ව්‍යාපෘතිය සඳහා මුල් ගල් තැබූ දිනය කවරේද;

(iii) අද වනතෙක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(iv) ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3221/’12

2.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂයේදී ශ්‍රී ලාංකික ජනගහනයේ ප්‍රතිශතය එක් එක් ආගම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් තොරතුරු 2012 වර්ෂයේ පැවති ජාතික සංගණනයේ තොරතුරු හා තහවුරුවන්නේද;

(iii) බලහත්කාරයෙන් පුද්ගලයින් ආගම්වලට හරවාගැනීම් වාර්තාවීම් එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බලහත්කාරයෙන් පුද්ගලයින් ආගම්වලට හරවාගැනීම් සිදුකළ පුද්ගලයින්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3448/’13

3.

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන සේවා කොමිෂන් සභාවේ නියමයන්ට අනුව විෂය අධ්‍යක්ෂ තනතුර සඳහා සපුරා තිබිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවය කරන විෂය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත අධ්‍යක්ෂවරුන් අතරින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II සහ III ශ්‍රේණිවලට අයත් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් එම ශ්‍රේණිවලට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත එක් එක් විෂය අධ්‍යක්ෂවරයාට පවරාදී තිබෙන විෂය හා රාජකාරි කටයුතු කවරේද;

(v) එම විෂය අධ්‍යක්ෂවරුන් අතරින් ගරු සේවයේ යෙදී සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් ඉහත සඳහන් විෂය අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම අධ්‍යක්ෂවරුන්ගේ අමතර දීමනා හා ගෙවීම් සිදුකරනු ලබන්නේ පළාත් සභාවෙන්ද; නැතහොත්, මධ්‍යම ආණ්ඩුවෙන්ද;

(iv) අධ්‍යාපන සේවා කොමිෂන් සභාව මගින් උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුමත ක්‍රියා පටිපාටියට බාහිරින් විෂය අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීම සඳහා විශේෂ බලයක් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3526/'13

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවස්ථාව ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3616/'13

5\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2006 සිට 2011 දක්වා කාලය තුළ නීති විද්‍යාල ප්‍රවේශ විභාගයට එක් එක් මාධ්‍ය අනුව පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත එක් එක් වර්ෂයේදී එම විභාගය සමත් සිසුන්ගේ ප්‍රතිශතය එක් එක් මාධ්‍ය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රශ්න පත්‍ර යතුරුලියනය කරනු ලබන්නේ කවරෙකු විසින්ද;

(iv) එය සිදු කරනු ලබන ස්ථානය කවරේද;

(v) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රශ්න පත්‍රවල සෝදුපත් පරීක්ෂා කරනු ලබන අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2011 වර්ෂයේ පැවති නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ අයදුම්කරුවන්ගේ සම්පූර්ණ නම, ලිපිනය, ස්ත්‍රී/පුරුෂභාවය, පෙනී සිටි මාධ්‍ය වැනි මූලික කරුණු දක්වා තිබුණේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3689/'13

6\.

ගරු අනුර දිසානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂය තුළ රැකියාවන් සඳහා විදේශගතවූ සමස්ත ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිස පුහුණු, නුපුහුණු, අර්ධ පුහුණු මධ්‍යම මට්ටම, ලිපිකරු, ගෘහසේවිකා හා වෙනත් යන වර්ගීකරණයන් යටතේ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශගතවූ ඉහත පිරිසට අයත් කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (ii) හි එක් එක් කාණ්ඩය යටතේ වූ කාන්තාවන් සංඛ්‍යාව, අදාළ වර්ෂයේ විදේශගත වූ සමස්ත කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4314/'13

7\.

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය පවත්වා, 2013 මැයි මස 03 වැනි දින එහි ප්‍රතිඵල නිකුත් කළ බවත්;

(ii) එකී විභාගයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවත්;

(iii) විභාගය සමත් නමුත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නොලැබූ පිරිසක් ඉතිරි වී ඇති බවත්;

(iv) ඔවුන්ගේ ප්‍රතිඵල සටහනෙහි ඔවුන් ලැබූ කුසලතාවය සටහන් කර දන්වා යවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වැනි පන්තියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) උක්ත විභාගයේ ප්‍රතිඵල මත පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගනු ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iii) තවදුරටත් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් ඉතිරිව තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීම සඳහා ඉහත විභාගයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද පුද්ගලයින් බඳවා ගත හැකි බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගත හැකි ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4319/'13

8.
ගරු අනෝමා ගමගේ මහත්මිය,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල සහ නියෝජිත තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම තැපැල් කාර්යාල මගින් දැනට පවත්වාගෙන යනු ලබන සේවාවන් කවරේද;

(iii) එම සේවාවන් ලබාදීම වෙනුවෙන් රජයට ලැබෙන වාර්ෂික ආදායම කොපමණද;

(iv) තැපැල් සේවාව පවත්වාගෙන යාමට යොදවා ඇති කාර්ය මණ්ඩලය එක් එක් තනතුර අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) තැපැල් සේවය පවත්වා ගෙන යාමේදී කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, නිවාස කුලී, ජල පහසුකම්, විදුලිය හා දුරකථන පහසුකම් ආදිය වෙනුවෙන් වාර්ෂිකව වැයවන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නව ටෙලිමේල් සේවාව සඳහා සෑම තැපැල් කාර්යාලයකටම අවශ්‍ය පහසුකම් සපයා තිබේද;

(ii) නොඑසේ නම්, නව ටෙලිමේල් සේවාව පවත්වාගෙන යෑමට සැලසුම්කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4416/'13

9.
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ විදුලි බලාගාරයේ සිට අනුරාධපුරය දක්වා විදුලිය සම්ප්‍රේෂණය කරන කිලෝවෝට් 220 අධි සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම නිසා අගතියට පත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සෑම පවුලකටම වන්දි ගෙවා තිබේද;

(iii) එලෙස ගෙවා ඇති වන්දි මුදල්වල වටිනාකම කොපමණද;

(iv) ඉහත සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේදී මෙතෙක් වන්දි නොලැබුණු, අවතැන්වූ පිරිසක් සිටින්නේද;

(v) එම පිරිසට වන්දි ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(vi) ඉහත ව්‍යාපෘතියට අදාළව ගෙවිය යුතු සියලුම වන්දි මුදල් ගෙවා අවසන් කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4434/'13

10.
ගරු තලතා අතුකෝරල මහත්මිය,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් කිරිපිටි මිල ඉහළ නැංවීමට අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) දැනට කිරිපිටි සඳහා උපරිම සිල්ලර මිලක් තිබේද;

(iv) එසේ නම්, එම මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) කිරිපිටි සඳහා උපරිම සිල්ලර මිලක් නියම කර තිබියදී, සමහර කිරිපිටි සමාගම් තම අභිමතය පරිදි එම මිල ඉක්මවා කිරිපිටි අලෙවි කරනු ලබන විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2614/'12

11.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හක්වටුනාව නමින් වාරි ව්‍යාපෘතියක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) හක්වටුනාව වාරි ව්‍යාපෘතිය යටතේ,

(i) අස්වද්දන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) යල මහ දෙකන්නයේම වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීමට හැකියාව තිබේද;

(iv) එම හැකියාව නොමැති නම්, එසේ කිරීමට හැකිවන පරිදි හක්වටුනාව වාරි ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3238/'12

12.
ගරු රවී කරුණානායක මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මිල්කෝ ආයතනයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3449/'13

13.
ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුහල්පතිවරුන් හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ බලය මධ්‍යම රජයේ අධ්‍යාපන සේවා කොමිෂන් සභාව සතුවූවක්ද;

(ii) උතුරු මැද පළාත් සභා අමාත්‍ය මණ්ඩලය විසින් එම බලතල අභිභවමින් පළාත් අධ්‍යාපන සේවය සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ බලතල එම පළාත් සභාවට ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, උතුරු මැද පළාත් අධ්‍යාපන කාර්යාලවල අනුයුක්ත ගුරු සේවයේ නිලධාරීන් විෂය අධ්‍යක්ෂ ධුර සඳහා බඳවා ගැනීම සිදුකර ඇති ක්‍රියා පටිපාටිය කවරේද;

(iv) පළාත් සභාව මගින් මධ්‍යම ආණ්ඩුවේ අනුමතියකින් තොරව බඳවා ගත් නිලධාරීන් සඳහා ගමන් වියදම් හා අමතර දීමනා ගෙවීම් සිදුකරන ආකාරය කවරේද;

(v) එම ගෙවීම් සිදුකරන්නේ උතුරු මැද පළාත් සභාවේ කවර වැය ශීර්ෂය යටතේද;

(vi) එම නිලධාරීන් සඳහා මුදල් ගෙවීම මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය යටතේ සිදුකරන්නේද;

(vii) එම මුදල් ගෙවීමේදී රජයේ මුදල් අයථා ලෙස භාවිත කොට තිබේ නම්, එසේ සිදුකළ නිලධාරීන්ට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3589/'13

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති විදේශ ආයෝජන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයෝජන සඳහා යොදවා ඇති මුළු මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අරමුදල් යොදවා ඇති කර්මාන්ත හෝ සේවා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශීය ආයෝජකයින් දිරි ගැන්වීම සඳහා ලබා දී ඇති සහන කවරේද;

(ii) 2010, 2012 සහ 2013 වර්ෂවලදී ඔවුන්ගේ කර්මාන්ත හෝ සේවා ස්ථාන ස්ථාපනය කිරීම සඳහා රජය මගින් ඉඩම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් ලබා දී ඇති පදනම කවරේද;

(iv) එලෙස ලබා දී ඇති එක් එක් ඉඩම් පිහිටි දිස්ත්‍රික්කය, ඉඩම් ප්‍රමාණය, ඉඩමේ නම සහ ලිපිනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3691/'13

15.

ගරු අනුර දිසානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ආදායම් ලැබෙන මාර්ග කවරේද;

(ii) 2005 වර්ෂයේ සිට 2012 දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඉහත ආදායම් මාර්ගවලින් ලැබුණු මුළු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඒ ඒ අවශ්‍යතා වෙනුවෙන් වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ක්‍රිකට් ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු නව වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 207/'14

1.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු මංගල සමරවීර මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු වසන්ත අලුවිහාරේ මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු විජයදාස රාජපක්ෂ මහතා

ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු කබීර් හෂීම් මහතා,— රජය කෙරෙහි විශ්වාස භංගත්වය,—

අග්නිදිග ආසියාව හා ගල්ෆ් වෙරළ සිසාරා ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම් සමූහයක් ඇති බව ඇෆ්ගනිස්ථානයේ, පකිස්ථානයේ, ඉන්දියාවේ සහ තවත් රටවල පොලිස් විමර්ශන මගින් හෙළිදරව් වී ඇතැයි මාධ්‍ය මගින් වාර්තා කර ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ අනෙක් රටවලට හෙරොයින් බෙදාහරින කේන්ද්‍රස්ථානය බවට පත් කරමින් ඇෆ්ගනිස්ථානයේ නිෂ්පාදිත හෙරොයින්,

(1) පකිස්ථානයට ගෙනැවිත් එතැනින් ශ්‍රී ලංකාව වෙත යොමු කෙරෙතැයි, හා

(2) පකිස්ථානයට හා පන්ජාබ් දේශ සීමාව හරහා ඉන්දියාවට ගෙනැවිත් අවසානයේදී ශ්‍රී ලංකාවට ගෙනෙතැයි,

එම විමර්ශනයන්ගෙන් හෙළිදරව් වී ඇති හෙයින්ද;

මෙම මත්ද්‍රව්‍ය ජාවාරම් සමූහය කලාපයේ යහපැවැත්මට තර්ජනයක් බවට පත් වී ඇති හෙයින්ද;

මෙම ජාවාරම් සමූහයට පකිස්ථානු, ඉන්දීය හා ශ්‍රී ලාංකික ජාතිකයින් සම්බන්ධව සිටින බවට එම විමර්ශන වලින් හෙළිදරව් වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ අස්සක් මුල්ලක් නෑර සෑම තැනකම මෙම මත්ද්‍රව්‍ය තිබෙන හෙයින් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ලාබාල අය හෙරොයින් භාවිතා කිරීම වැඩි වී ඇති හෙයින්ද;

අග්‍රාමාත්‍ය රාජීව් ගාන්ධි මහතා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර පොලිසියට අවශ්‍යව ඇති සහ කුය ලෙස මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට සම්බන්ධ බවට වාර්තා වන කුමරන් පද්මනාදන් නමැත්තා රජයේ ආරක්ෂාව යටතේ ශ්‍රී ලංකාව තුළ වාසය කරන හෙයින්ද;

2013 අගොස්තු මාසයේදී අග්‍රාමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ඊස්ට් ඒසියා ගේට්වේ ටර්මිනල් නමැති ආයතනයේ කළමනාකරු වෙත ලිපියක් නිකුත් කරමින්, බහාලුමක් මුදාහරින ලෙස ඉල්ලා සිටි අතර එහි මත්ද්‍රව්‍ය අඩංගුව ඇති බව සොයා ගනු ලැබූ හෙයින්ද;

අදාළ සම්බන්ධීකරණ ලේකම්වරයාගේ 2013 දෙසැම්බර් මස 9 වැනි දිනැති ඉල්ලා අස්වීමේ ලිපිය මගින් ඔහු මෙම ගනුදෙනුවට සම්බන්ධ බව පෙනී යන හෙයින්ද;

මෙම ජාවාරම් කණ්ඩායම මුලිනුපුටා දමනු පිණිස ඉන්දියාවේ හා පකිස්ථානයේ බලධාරීන් සමග සම්බන්ධීකරණය වීමට රජය අසමත් වී ඇති හෙයින්ද;

මෙරටට හොරෙන් ගෙන ඒමේදී අල්ලා ගනු ලබන විශාල මත්ද්‍රව්‍ය තොග සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් කිරීමට රජය අසමත් වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය බෙදා හැරීම තුරන් කරනු පිණිස කිසිදු හරවත් ක්‍රියා මාර්ගයක් ගනු නොලබන හෙයින්ද;

මෙම උවදුර පාලනය කිරීමට හා මර්දනය කිරීමට රජය අකමැති බව පෙනී යන හෙයින්ද;

කිසිදු පරීක්ෂා කිරීමකින් තොරව බහාලුම් මුදා හරිනු ලබන බවට වූ මෑත කාලීන වාර්තා මගින් පෙනී යන පරිදි, මෙම උවදුර බාධාවකින් තොරව දිගටම සිදුවන බව පෙනී යන හෙයින්ද;

මෙමගින් වර්ෂ 2500 කට වැඩි අභිමානවත් ඉතිහාසයක් පිළිබඳව උදම් අනන මෙම දේශයේ සාමාජීය හා ආර්ථික ව්‍යුහය කෙරෙහි විනාශකාරී ප්‍රතිවිපාක අත්වනු ඇති හෙයින්; සහ

මෙය අඛණ්ඩව සිදු වුවහොත් ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය රාජ්‍යයක් බවට පත් වී රටේ අනාගතය මහත් අනතුරකට පත් විය හැකි හෙයින්ද;

සිය පුරවැසියන්ගේ සුභසාධනය තහවුරු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට රජයට ඇති හැකියාව පිළිබඳ විශ්වාසය බිඳ වැටී ඇතැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 23 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 23 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 01002 ''අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 7,000,000 සිට<br>රු. 12,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 12,000,000 සිට<br>රු. 20,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 24 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 24 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 ''පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය

ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම, පරිවර්තන ගාස්තු හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,500,000,000 සිට රු. 2,350,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.1,000,000,000 සිට රු.1,950,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 25 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 25 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 "රජයේ කර්මාන්තශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්තශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට රු. 450,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 26 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 26 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 330,000,000<br>රු. 416,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 330,000,000<br>රු. 416,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,450,000,000 සිට රු. 1,700,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 800,000,000 සිට රු. 1,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 28 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

# 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 28 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "රජයේ කර්මාන්තශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්තශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000<br>රු. 200,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 20,000,000<br>රු. 92,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2013 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා සංශෝධනය කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | රාජ්‍ය කළමණාකරන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 17301 | 2,500,000 | 2,555,000 | - | - | - | - | 1 |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 25601 | - | - | 58,000,000 | 54,000,000 | - | - | 2 |
| 3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 27001 | - | - | 46,000,000 | 40,000,000 | - | - | 3 |
| 4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | 27201 | - | - | 75,000,000 | 69,000,000 | - | - | 4 |
| 5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | 27401 | - | - | 42,000,000 | 39,000,000 | - | - | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව | 27501 | - | - | 20,000,000 | 17,000,000 | - | - | 6 |
| 7 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | 27801 | - | - | 37,000,000 | 32,000,000 | - | - | 7 |
| 8 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | - | - | 1,250,000,000 | 1,200,000,000 | - | - | 8 |
| 9 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 18101 | - | - | - | - | 10,000,000 | 17,500,000 | 9 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 28801 | - | - | 100,000,000 | 97,000,000 | - | - | 10 |
| 11 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 25401 | - | - | - | - | 22,000,000 | 200,000,000 | 11 |
| 12 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 29301 | - | - | 11,000,000 | 10,200,000 | - | - | 12 |
| 13 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 900,000,000 | 662,000,000 | - | - | 13 |
| 14 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 12201 | - | - | 3,700,000 | 3,300,000 | - | - | 14 |
| 15 | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 17901 | - | - | 4,000,000 | 2,200,000 | - | - | 15 |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | 25801 | - | - | 52,000,000 | 49,000,000 | - | - | 16 |
| 17 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 10301 | 285,000,000 | 200,000,000 | 120,000,000 | 110,000,000 | 650,000,000 | 500,000,000 | 17 |
| 18 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 22201 | - | - | 1,750,000,000 | 1,600,000,000 | - | - | 18 |
| 19 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | - | - | 415,000,000 | 370,000,000 | - | - | 19 |
| 20 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 32001 | - | - | 160,000,000 | 154,000,000 | - | - | 20 |
| 21 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 28101 | - | - | 140,000,000 | 139,000,000 | - | - | 21 |
| 22 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 30501 | - | - | 1,000,000 | 900,000 | - | - | 22 |
| | එකතුව | | 287,500,000 | 202,555,000 | 5,184,700,000 | 4,648,600,000 | 682,000,000 | 717,500,000 | |

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.25 දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

17.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

අල් ජමියාතුල් ඝ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ශ්‍රී ලංකා විශ්ලේෂණ රසායනාගාර සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

සුසන්ත පුංචිනිලමෙ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

23.

සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

24.

ජයවික්‍රම පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

25.

වැලන්හින්න වාචිස්සර ජාත්‍යන්තර සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

26.

පියසේන ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

27.

මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

28.

අලෙවි මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

සෙයියිද් අබ්දුර් රහ්මාන් ජිෆ්රි මව්ලානා අනුස්මරණ අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**